# ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍ය කාර්යාලය

## Office of the Minister of Sports and Youth Affairs

ෆැක්ස්
தொலைநகல் 011-2675072
Fax

වෙබ්
இணையதளம் www.moys.gov.lk
Web


ගේ අංකය
னது MIN/SPYA/S/519
My No.

දිනය
திகதி. 2023.03.27
Date

ගරු රොෂාන් රණසිංහ මැතිතුමා,
ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍ය

ගරු අමාත්‍යතුමනි,

<u>**සේවයෙන් ඉල්ලා අස්වීම - උපදේශක තනතුර**</u>

ඔබතුමා විසින් මාගේ නිවසට පැමිණ ඔබගේ උපදේශක තනතුර බාරගැනීම සඳහා කරන ලද ආරාධනාව මා විසින් පිළිගනු ලැබුවේ ඔබව අනාගත දේශපාලනයේ උසස් මට්ටමකට ගෙනඒමේ අදහස පෙරදැරි කරගෙනය.

ගරු ජනාධිපතිතුමාගේ අවසරය ඇතිව ඔබතුමාගේ උපදේශක වශයෙන් සහ ජාතික ක්‍රීඩා සභාවේ සාමාජිකයෙකු වශයෙන් මා පත්කර ගැනීමට තරම් මා කෙරෙහි තැබූ විශ්වාසය කෙරෙහි ප්‍රථමයෙන්ම මාගේ අවංක ස්තූතිය පිරිනමමි.

කිසිඳු බලපෑමකින් තොරව නිදහසේ රාජකාරී ඉටුකිරීමට තරම් මාහට මානසික තත්වයක් ඇතිවූයේ ඔබ විසින් මා ගැන තබන ලද එම විශ්වාසය නිසාවෙනි.

එනමුත් පසුගිය දින කිහිපයේ සිදුවූ යම් යම් සිද්ධීන් නිසා මා බලවත් කම්පාවට සහ පීඩනයට පත්ව සිටිමි. එම කරුණු වලට ප්‍රධානතම හේතුව වූයේ ජාතික ක්‍රීඩා සභාවේ සභාපති අර්ජුන රණතුංග නැමැත්තාගේ අදූරදර්ශී, කුහක හැසිරීම බව මා නිර්භයව ප්‍රකාශ කරමි.

ඊට හේතු වූ කාරණා මා කෙටියෙන් මෙසේ සඳහන් කර සිටිමි.

01. 1980 සිට වර්තමාන ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ දේශපාලන ජීවිතයේ එතුමාගේ සෙවනැල්ල මෙන් සිට මා ලබාගත් අත්දැකීම් තුළින් එතුමා මෙන්ම මාද දූෂණයට, ඩීල් දැමීමට සහ අයථා මුදල් ඉපැයීම් වලට සම්බන්ධ වී නොමැත. අවුරුදු 37ක එතුමා සමග පැවති දේශපාලන ගමන් මගේදී මා අයථා ලෙස මුදල් උපයා නැත.

මාගේ නිකැළැල් නාමය මා සදාකල් ආරක්ෂා කරමි. එය මාගේ ප්‍රතිපත්තියයි.

නමුත් අර්ජුන රණතුංග විසින් මා ක්‍රිකට් ආයතනයෙන් අයථා ලෙස මුදල් ලබාගෙන ඇති බවට ප්‍රචාරයක් ගෙනයන අතර, එය ඔබතුමාටද පවසා ඇති බව මා දනිමි. එසේ අයථා ලෙස මුදල් ඉපැයුවේ නම් මා අදටත් කුලී නිවසක ජීවත්වීමට අවශ්‍යතාවයක් ඇති පුද්ගලයෙකු නොවේ. මාගේ පුද්ගලික මෝටර් රථයට මිලියන 04ක් සහ බැංකු ණය මිලියන 03ක මුදලක් තවමත් මා විසින් බැංකුවට ගෙවීමට ඇත.

01. අර්ජුන රණතුංගට අවශ්‍ය වූයේ කිසිදු දිනක ඡන්දයකින් ඔහුට දිනාගත නොහැකි ක්‍රිකට් ආයතනයේ පාලනය තම අතට ලබා ගැනීමයි. ඔහු මා සමග පවසා සිටියේ කුසලා සරෝජිනී වාර්තාව උපයෝගිකර ගෙන ක්‍රිකට් ආයතනය විසුරුවා හැර ඔහුගේ සභාපතිත්වයෙන් ක්‍රිකට් අතුරු පාලක මණ්ඩලයක් පත් කිරීම සිදුකල යුතු බවයි. ලැබුන අවස්ථාවෙන් ප්‍රයෝජනය ගතයුතු බවත් තමාට පරිපාලනය පිලිබඳව දැනීමක් නොමැති නිසා එයට වඩාත්ම හැකියාවක් තම සොහොයුරු නිශාන්ත රණතුංග ලේකම් ලෙස පත්කර ගතයුතු බවයි. නමුත් මේ සඳහා මගේ විරෝධය ප්‍රකාශ කල පසු ඔහු මලික් සමරවික්‍රම මහතාට එම යෝජනාව ඉදිරිපත් කල අතර මලික් මහතා පවසා ඇත්තේ ජාත්‍යන්තර තහනමකට ලක්විය හැකි බැවින් එය සිදු කිරීම සුදුසු නැති බවයි.

02. ඔහුගේ ක්‍රියාවට මා බාධාවක් වූ බැවින් මගේ බිරිදට නිර්නාමික දුරකථන ඇමතුම් මගින් මරණීය තර්ජන එල්ල කිරීම සම්බන්ධයෙන් මා විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පැමිණිලි කර, සිදුකල විමර්ෂණයේදී අර්ජුන රණතුංගගේ මවගේ සහෝදරයාගේ පුතා වන නාථ් ගුණසේකර යන අය (දුරකථන අංකය 0777748417) විසින් එය සිදුකර ඇති බවට සියලුම තොරතුරු මේ වන විට සොයාගෙන ඇති අතර එය අධිකරණට ඉදිරිපත් කිරිමට නියමිත කටයුත්තක් බැවින් ඒ සම්බන්ධයෙන් ඉදිරියේ දි කරුණු ඉදිරිපත් කරමි.

පරිපාලනය පිලිබඳ කිසිදු ආකාරයේ දැනීමක් නැති, තමන් ගැන පමනක් සිතන, ක්‍රිකට් ආයතනයට කෙසේ හෝ රිංගා ගැනීමට උත්සහ කරන කුහකයෙකු සමග මෙම අමාත්‍යාංශයේ තවදුරටත් සේවය කිරීමට මට අවශ්‍යතාවයක් නොමැත. ඔහුට විරුද්ධව ඉදිරියේදී මා විසින් දැඩි ක්‍රියාමාර්ගයකට එළඹීමට තීරණය කර ඇති අතර, අමාත්‍යාංශය තුළ සේවය කරමින් මා එම ක්‍රියාමාර්ගයට එළඹීම සදාචාරසම්පන්න නොවේ .

මෙම කරුණු අධ්‍යානය කර, මාගේ ඉල්ලා අස්වීම පිළිගන්නා ලෙසට ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිමි. එසේම මා හා ඔබ පවුල අතර පැවති හිතවත්කම් එලෙසම ආරක්ෂා කර ගනිමින්, ඔබගේ අනාගත දේශපාලන ජීවිතය සාර්ථක කර ගැනීම සඳහා උපරිම සහයෝගය ලබාදෙන බව සඳහන් කරනු කැමැත්තෙමි.

මෙයට - විශ්වාසී

(අත්සන) 2023/03/27
සුදත් චන්ද්‍රසේකර
ජ්‍යේෂ්ඨ උපදේශක

පිටපත් (1) - ගරු ජනාධිපතිතුමා ( දැ.ගැ.ස)
(2) - ලේකම්, ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය - ( සු.කා.ස)
(3) - ගොනුවට

පුද්ගලික කාර්ය මණ්ඩලයේ,
ගරු ඇමතිතුමා විසින් මාගේ ඉල්ලා අස්වීම භාර නොගත් බැවින් ඉදිරි කටයුතු අභිමුඛවීමට ක්‍රියා කරන්න.

(අත්සන) 23/03/27
සුදත් චන්ද්‍රසේකර
ජේ. උපදේශක